**ආර්ථික අර්බුදයේ බලපෑම් අවම කිරීම සහ සමාජ ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා වූ අන්තර්ගත සම්බන්ධතා සහ සංවර්ධන අවිනිශ්චිත හා හදිසි අවශ්‍යතා සංරචක ව්‍යාපෘතිය-2 (CERCs-2) -2023**

---

ආර්ථික අර්බුදයේ බලපෑම් අවම කිරීම සහ සමාජ ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා වූ අන්තර්ගත සම්බන්ධතා සහ සංවර්ධන අවිනිශ්චිත හා හදිසි අවශ්‍යතා සංරචක ව්‍යාපෘතිය-2 (CERCs-2) හි 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ලෝක බැංකුව අතර ඇති කර ගත් 2021 නොවැම්බර් 03 දිනැති අංක: 9290-එල්කේ දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ කාලය

ණය ගිවිසුම අනුව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරන ආයතන වන අතර කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. සමාජ ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කරමින් රටේ දිළිඳු හා අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ට වත්මන් ආර්ථික අර්බුදයේ අහිතකර බලපෑම් අවම කිරීම සඳහා කෙටි හා මධ්‍ය කාලීන මැදිහත්වීමක් ලබා දීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ කටයුතු, 2022/23 මහ කන්නය සඳහා යූරියා ප්‍රසම්පාදනය, සමෘද්ධි, වැඩිහිටි, ආබාධිත සහ නිදන්ගත වකුගඩු රෝගී වැඩසටහන්වල ප්‍රතිලාභීන් සඳහා මුදල් ලබා දීම සහ ලිට්‍රෝ ගෑස් ප්‍රසම්පාදනය යන අංග 03 යටතේ ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 108,062 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 325 ක් වූ අතර ලෝක බැංකුව විසින් එම මුදල මූල්‍යකරණය කිරීමට එකඟ විය. ව්‍යාපෘතිය 2022 මැයි 09 වන දින එහි කටයුතු ආරම්භ කර 2024 මැයි 09 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

## 1.3 මතය

2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය සහ සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2 . මූල්‍ය කාර්ය සාධනය

### 2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල මූල්‍ය ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂය සඳහා ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් වෙන් කර නොතිබූ අතර මුළු ප්‍රතිපාදන රු.මිලියන 12,642ක් පරිපූරක ප්‍රතිපාදන සහ මු.රෙ. 66 හරහා වෙන් කර තිබුණි. | සැපයුම්කරු විසින් පොහොර මෙ.ටොන් 27,987.02ක් සපයා ඇතත්; ලිවන් නියුට්‍රිෂන් පෞද්ගලික සමාගම 2022 දෙසැම්බර් 22 දින වරායට ළඟා වූ අතර, ලෝක බැංකුව එම සැපයුම සඳහා 2023 ජනවාරි 03 දින ගෙවා තිබුණි. එබැවින් 2023 වර්ෂයේදී එම වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම අවශ්‍ය විය. තවද 2022 දී සැලසුම් කළ පරිදි පොහොර ආනයනය සිදු නොවූ බැවින් 2023 දී ඉතිරි පොහොර ප්‍රමාණය මිලදී ගැනීමට තීරණය කරන ලදී. එබැවින් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පරිපූරක ප්‍රතිපාදන සහ මු.රෙ. 66 මඟින් වෙන් කරන ලදී. | ව්‍යාපෘතිවල අරමුණු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන් කළ යුතුය |

**2.2 අරමුදල් භාවිතා කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| මෙම ව්‍යාපෘතිය යටතේ යූරියා පොහොර මිලදී ගැනීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 110ක් වෙන් කර තිබුණද, එයින් 2023 දෙසැම්බර් 31 වන විට භාවිත කර තිබුණේ ඇමෙරිකානු ඩොලර් මිලියන 100.13ක් පමණි. | එකඟ විය. | වෙන් කර ඇති අරමුදල් උපරිමයෙන් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘතියේ ගිණුම්වලට අනුව ඇමෙරිකානු ඩොලර් 5,226,053 ට සමාන රු.මිලියන 1,698ක් ව්‍යාපෘතියේ අරමුණු සඳහා භාවිතා නොකර ණය දෙන නියෝජිතායතනයට ආපසු ලබා දී තිබුණි. | එකඟ විය. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය සඳහා ඉතිරිව ඇති අරමුදල් මුල් අන්තර්ගත සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය වෙත ආපසු ලබා දීමට ලෝක බැංකුවට යවන ලදී. | වෙන් කර ඇති අරමුදල් උපරිමයෙන් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

| සංරචකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) සමෘද්ධි, වැඩිහිටි, ආබාධිත සහ නිදන්ගත වකුගඩු රෝගී වැඩසටහන්වල ප්‍රතිලාභීන් සඳහා මුදල් ලබා දීම. | (i) ව්‍යාපෘතිය යටතේ මුදල් සහනාධාර (සමෘද්ධි, වැඩිහිටි, වකුගඩු රෝග, ආබාධිත දීමනා) ලබාදීමට ඇමරිකන් ඩොලර් මිලියන 145ක් වෙන් කර තිබුණද, එයින් 2023 දෙසැම්බර් 31 වන විට ඇමරිකන් ඩොලර් මිලියන 140ක් පමණක් භාවිත කර තිබුණි. එසේම ඊට අදාළ ප්‍රතිලාභීන්ගේ ලැයිස්තුව. ඉහත මුදල් සහනාධාර ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය විසින් තහවුරු කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන්ට මුදල් ගෙවීම සමෘද්ධි බැංකුව හරහා සිදුකෙරිණි. ඒ අනුව, ප්‍රතිලාභීන්ගේ ලැයිස්තු ඇතුළුව සියලුම ගෙවීම් තොරතුරු ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සහ සමෘද්ධි බැංකුව විසින් නඩත්තු කළ යුතුය. | වෙන් කරන ලද අරමුදල් උපරිම ලෙස භාවිතා කිරීමට සහ නිවැරදි පුද්ගලයින්ට මූල්‍ය සහනාධාර ලබා දී ඇත්ද යන්න තහවුරු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2022/23 මහ කන්නය සඳහා යූරියා ප්‍රසම්පාදනය | (i) ඉන්වොයිසිවලට අනුව, 2022/23 මහ කන්නයේ සහ 2023 යල කන්නයේ ගොවීන්ට බෙදා හැරීම සඳහා යූරියා පොහොර මෙට්‍රික් ටොන් 137,400ක් කොළඹ කොමර්ෂල් පොහොර සමාගම සහ ලංකා පොහොර සමාගම වෙත නිකුත් කර තිබුණි. ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විගණනයට | 2023 නොවැම්බර් 22 වැනි දින පැවති රැස්වීම් සාකච්ඡාවේදී ගනු ලැබූ තීරණ අනුව සහ අංක SMFI/3/D/06/08 දරණ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු ලිපිය හා ලෝක අංක SMFI /3/D/06/08 ලෝක බැංකු වෙළුම V හි සඳහන් පරිදි කෘෂිකර්ම හා වැවිලි | නිවැරදි තොරතුරු පැහැදිළි කර ගැනීමටත්, බෙදාහැරීම අපේක්ෂා කළ පරිදි සිදු වී ඇත්ද යන්න තහවුරු කිරීමටත් කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සපයා ඇති තොරතුරුවලට අනුව ආනයනය කරන ලද යූරියා පොහොර ප්‍රමාණය මෙ.ටොන් 137,848ක් විය. ඒ අනුව යූරියා පොහොර මෙට්‍රික් ටොන් 448 ක තහවුරු නොකළ වෙනසක් නිරීක්ෂණය විය.<br><br>(ii) යූරියා පොහොර මෙ.ටොන් 137,848ක් නිකුත් කර තිබුණද ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය මගින් මෙ.ටොන් 123,540ක් පමණක් ලද බවට තහවුරු කර තිබුණි. එබැවින්, යූරියා පොහොර මෙට්‍රික් ටොන් 14,308 ක නොසැසඳූ / තහවුරු නොකළ බෙදාහැරීමක් නිරීක්ෂණය විය. එමෙන්ම පොහොර බෙදා හැරීමට අදාළ ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනය ලබා දී නොතිබුණි. | අමාත්‍යාංශය විසින් එම පොහොර බෙදා හැරීමට අදාළ කරුණු 2023 නොවැම්බර් 29 දිනැති අංක TO/SL&TG/01/37/02 දරණ ලිපිය මගින් අප දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි.<br><br>ඒ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ මිලදී ගත් යූරියා මෙ.ටොන් 137,848.33 න් යූරියා මෙ.ටොන් 118,872.18ක් ගොවීන් වෙත බෙදා දී ඇත. තවද මෙට්‍රික් ටොන් 18,976.15ක ඉතිරි ප්‍රමාණය ගොවීන් වෙත බෙදා හැරීම පිළිබඳ තොරතුරු සපයන ලෙස මෙම දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා තිබුණි. එමෙන්ම යූරියා මෙට්‍රික් ටොන් 137,848.26 න් මෙ.ටොන් 123,540.785ක් බෙදා හැරීමට අදාළ සියලුම තොරතුරු මේ වන විටත් මෙම දෙපාර්තමේන්තුවට පිටපතක් සමඟ ලෝක බැංකුවට ඉදිරිපත් කර ඇති අතර ඉතිරි මෙට්‍රික් ටොන් 14,307.255 සඳහා 2024 ජූනි 18 දිනැති අංක එන්.පී. /CERS/2/2022/Agri දරණ ලිපිය මගින් තොරතුරු ඉල්ලා ඇත. | අපේක්ෂිත පරිදි නිවැරදි පුද්ගලයන් සඳහා බෙදාහැරීම සිදු කර තිබේද යන්න තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |